# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1757/2 — 2012 මැයි 08 වැනි අඟහරුවාදා - 2012.05.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

නැගෙනහිර පළාත් සභාවේ 2009 අංක 02 දරන නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය යටතේ සාදා ප්‍රසිද්ධ කරනු ලබන නියෝග සංශෝධනය

2009 සැප්තැම්බර් මස 28 වැනි දින *අංක 1621/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වූ නැගෙනහිර පළාත් සභාවේ, 2009 අංක 02 දරන නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි නියෝගවල 4 වැනි උපලේඛනය අවලංගු කොට ඒ වෙනුවට පහත සඳහන් උපලේඛනය ආදේශ කරනු ලැබේ.

මෙම නියෝග 2012 මැයි මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

විමලවීර දිසානායක,<br>
අධ්‍යාපන, සංස්කෘතික කටයුතු,<br>
ඉඩම් හා ඉඩම් සංවර්ධන සහ ප්‍රවාහන අමාත්‍ය,<br>
නැගෙනහිර පළාත් සභාව,<br>
ත්‍රිකුණාමලය.

2012 මාර්තු මස 14 වැනි දින,<br>
ත්‍රිකුණාමලය,<br>
නැගෙනහිර පළාත් සභාවේ,<br>
අධ්‍යාපන, සංස්කෘතික කටයුතු, ඉඩම් හා ඉඩම් සංවර්ධන සහ ප්‍රවාහන අමාත්‍යාංශයේ දී ය.

1A - PG 001357 — 340 (2012/05)

උපලේඛනය 4

*අධිකාරිය විසින් නියම කරන ලද ගාස්තුව*

01. මෙම උපලේඛනයේ I වැනි තීරුවේ දක්වා ඇති කිසියම් විෂයක යම් කාර්යයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ දක්වා ඇති ගාස්තු ප්‍රමාණය විය යුතුය.

| *අනු අංකය* | *I වැනි තීරුව කාරණය* | *II වැනි තීරුව ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය රු. ශත* |
|---|---|---|
| 1. | අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 250.00 |
| 2. | මගී සේවා අවසරපත්‍රයක් අළුත් කිරීමේ වාර්ෂික ගාස්තුව | 3,000.00 |
| 3. | මගී සේවා අවසරපත්‍රයක් නියමිත දිනට දීර්ඝ නොකිරීම නිසා සමුච්චිත වන හිඟ මුදල මත 10%ක අධිභාරයක් අයකිරීම | |
| 4. | අතුරු මාර්ග සටහනක් සඳහා (වර්ෂයකට හෝ ඉන් කොටසකට) | 1,500.00 |
| 5. | මගී සේවා අවසර පත්‍ර පොත අස්ථානගත වීම නිසා (අනු පිටපතක් නිකුත් කිරීම) | 5000.00 |
| 6. | මගී සේවා අවසරපත්‍ර පොතේ පිටු අවසන් වීම/අබලන්වීම හේතුවෙන් අනු පිටපතක් නිකුත් කිරීම | 500.00 |
| 7. | විශේෂ චාරිකා බලපත්‍ර එක් දිනකට | 500.00 |
| 8. | විශේෂ චාරිකා එක් දිනකට වැඩිවන දිනයක් සඳහා | 100.00 |
| 9. | තාවකාලික බලපත්‍ර (දිනකට) | 200.00 |
| 10. | මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කිරීම (සාමාන්‍ය සේවා) | 50,000.00 |
| 11. | අවසර පත්‍රයක් වෙනත් ඉල්ලුම්කරුවෙකුට පවරාදීම | 100,000.00 |
| 12. | අවසරපත්‍ර හිමියා මියගිය විට නීත්‍යානුකුල අයිතිය හිමිවන පුද්ගලයාට අවසරපත්‍රය පැවරීම (භාර්යාවට/ස්වාමියාට හෝ දරුවන්ට) | 3,000.00 |
| 13. | අවසරපත්‍ර හිමියා මියගිය විට නීත්‍යානුකුල අනුප්‍රාප්තිකයෙකු නොවන පුද්ගලයෙකුට අවසරපත්‍රය පැවරීම (අංක 10 යන ගාස්තු ක්‍රමය අදාල වේ.) | |
| 14. | බස්රථයක කාලසටහනක අනු පිටපතක් නිකුත් කිරීම | 100.00 |
| 15. | ධාවකයින්ගේ පොදු ඉල්ලීම මත එක බස්රථයකට කාල සටහන් සංශෝධනයකට (අධිකාරිය එකඟවන අවස්ථාවල) | 250.00 |
| 16. | අතිරේක ගාස්තු සටහන් නිකුත් කිරීමට | 50.00 |
| 17. | ධාවකයින්ගේ පොදු ඉල්ලීම මත බස්රථ කාර්ය චක්‍ර සංශෝධන | 100.00 |
| 18. | මගී සේවා අවසරපත්‍රයට අදාළ බස්රථය මාරු කිරීම | 1,500.00 |
| 19. | මගී සේවා අවසරපත්‍රයට අදාළ සේවාව සංශෝධනය කිරීම (ධාවක ඉල්ලීම මත) | 3,000.00 |
| 20. | සේවා ගාස්තු (මසකට හෝ ඉන් කොටසකට) | 500.00 |
| 21. | පිවිසුම් ගාස්තු (මසකට හෝ ඉන් කොටසකට) | 1,000.00 |
| 22. | සේවා ගාස්තු /පිවිසුම් ගාස්තු නියමිත දිනට ගෙවීම ප්‍රමාදවීම නිසා සමුච්චිත වන හිඟ මුදල මත 10% ක අධිභාරයක් අය කිරීම. | |
| 23. | කාලසටහන් හෝ වෙනත් පරිගණක මුද්‍රිත සටහන් ලබා ගැනීම - මුද්‍රිත එක් කොළයකට | 50.00 |
| 24. | මසකට දින 06 ක් බස්රථයක් පරීක්ෂා කිරීම හා බස් හිමියාට පරීක්ෂණ වාර්තා සැපයීමට බස්රථයකට අයකරන ගාස්තුව (ධාවකයාගේ එකඟතාවය මත) | 3,000.00 |

05-514

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.